
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 6 4 6 7 8
LONDON NW3 9LS
E N G L A N D

*Phone* : 0 2 0 7 4 2 8 9 3 8 8
*Fax* : 0 8 7 1 9 0 0 5 1 6 3
*E-mail* : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe
චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න ලොකුලියන
*Computer Graphics* : Channa Lokuliyana
ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam



## බුදුන් වැන්දාට අත්අඩංගුවට

සෞදි අරාබියේ රැකියාවකට ලංකාවේ සිට ගොස් සිටින සිංහළ බෞද්ධයෙකු වන ප්‍රේම-නාත් තුංගසිරි තමා රැකියාව කළ ස්ථානයට නුදුරින් නැවතී සිටි කාමරයේ ලංකාවෙන් ගෙන ගිය කුඩා බුදුපිළිමයක් තබාගෙන එයට වන්-දනාමාන කරන සිරිතක් තිබුණේය. දිනක් ඔහු එසේ බුදුන් වඳිමින් සිටියදී එහි පැමිණි පොලි-සිය බුදු පිළිමය සමග ඔහු අත්අඩංගුවට ගෙන රැගෙන ගියහ. වරද බුදු පිළිමයකට වන්දනාමාන කිරීමයි. දැන් ඔහු සිරබාරයේ පසුවෙයි. වරදකරු වුවහොත් ඔහුට ලැබෙන දඬුවම කුමක්දැයි කිව නොහැකිය. සමහර විට ඔහුගේ ගෙල කපා මැරීමට තීන්දු විය හැකිය. අරාබි උසාවි වල හැටි එහෙමය. දෙන දෙයක් සතුටින් බාරගත යුතුය. එපමණය.

පාර්ලිමේන්තු මන්ත්‍රී රන්ජන් රාමනායක මහතා මේ සිද්ධිය ගැන දිවයින පුවත්පතට කළ ප්‍රකාශයක් මෙහි 8 වන පිටුවේ පළවේ. මැදපෙරදිග රැකියාවලට ගොස් සිටින අපේ පිරිමින් සහ කාන්තාවන් මුහුණපාන කරදර හා විඳින අතවර සහ ඔවුන්ගේ දුක් ගැනවිලි ගැන බොහෝ විට සොයා බලන ඒ මහතා ඒ දේවල් විස්තර සහිතව අප රටේ පුවත්පත් වල පළකළ වාර අනන්ත ය.

තමන් කැමති ආගමක් ඇදහීම මානව අයිතිවාසිකමකි. එයට බාධාකළ නොහැකි ය. ආහාරපාන, බෙහෙත් ප්‍රතිකාර, අධ්‍යාපනය ආදි දේ ලැබීමට සෑම මනුෂ්‍යයෙකුට ඇති අයිතිය සේම තමන්ගේ ආගම ඇදහීම ද අයිතියකි. එහෙත් මුස්ලිම් රටවල ඉස්ලාම් දහම හැර අන් ආගමක් අදහනවාට විරුද්ධය. ඇතැම් මුස්ලිම් රටවල ඒ විරෝධය ප්‍රකටව පෙන්නුම් නොකළත් ඇතුළතින් එය ඇති බව කවුරුත් දනිති. එහෙත් සවුදිඅරාබියාව මානව හිමිකම් යන්න තුට්ටුවකට ගණන්ගන්නා රටක් නොවේ. ඒ නිසා ඔවුන් අන් ආගම් පිළිකුල් කරනවා පමණක් නොව එය ඇදහුවොත් ගෙළ සිඳ මරණයට පත්කිරීමට කිසිදු මැලිකමක් නැත.

අරාබි ගුවන්තොටුපළවල් හි රේගුවේදී එහි යන විදේශිකයින් සෑම දැඩි පරීක්ෂාවට ලක්වෙයි. වැඩිපුරම බලන්නේ මත්ද්‍රව්‍ය සහ ආගමික සංකේත භාණ්ඩය. කුරුස, බයිබල, බුදු පිළිම, බුද්ධ පින්තූර අහුවුනොත් හෙම ඒවා කෙළින්ම කුණු බක්කියට විසිකරනවාට අමතරව දැඩිලෙස අවවාද කෙරෙයි.

අරාබියේ රැකියාව කළ ලංකා කාන්තාවක් අපට වරක් කීවේ ඇය රැකියාව කළ ගෙදර ඇගේ කාමරයේ වූ ඇයගේ සූට්කේස් එකේ බුදුහාමුදුරුවන්ගේ රූපය ඇති කුඩා වෙසක් කාඩ්එකක් සඟවා තබාගෙන එයට වැඳ යළිත් සඟවා තබන බවයි. ඇය බුදුන් වැන්දේ ඒ විදියටය. ලොවපුරා සිටින දහසක් හියුමන් රයිට්කාරයින් කිසි එකෙක් මේගැන විරුද්ධව එකද වචනයක් කියා නැත. තලේබාන් මුස්ලිම් කාරයින් බැමියන් මිටියාවතේ වසර දහස් ගණනක් පැරණි දැවැන්ත බුදු පිළිමයක් දින දෙකක් පුරා මෝටාර් වෙඩි ගසා සුණුවිසුණු කළ හැටි මුලු ලොවම බලාගෙන සිටියේය. බෞද්ධ අපේ හදවත් දරාගත නොහැකි මහා වේදනාවකට හැරෙද්දී බීබීසී එකට එය අගනා නිවුස් එකක් පමණක් විය.



# ලොව ඇස ඇරවූ බුදුවදන

තමනුත් ඇස් ඇරගෙන ලෝක සත්වයාගේත් ඇස් අරවනු පිණිස ලොවුතුරා බුදුවරු බුදුවෙති. මෙහිදී ඇස් ඇරීම යන කාව්‍යෝක්තයෙන් මසැස නමැති බාහිර ඇස ඇරීම නොව මනැස නමැති අභ්‍යන්තර ඇස නොහොත් ඇතුළු ඇස නමැති පැණැස නොහොත් ප්‍රඥාක්ෂිය නමැති නුවණැස දල්වී අවදිවීම, අදහස්, වේග, පුහුදුන් සිත් සතන් වසාගෙන පැතිරෙන මොහඳුර, දුරලන ප්‍රඥාලෝකය දල්වා ප්‍රඥාක්ෂිය නමැති ඇතුළු ඇස අවදිවී විවෘතවීම බුදු වදනින් සිදුවන ප්‍රධානම කාරියයි.

බුදු හිමියන් පළමුවන වරට තව කෙනෙකුගේ ප්‍රඥාවයයි කියනු ලබන අභ්‍යන්තර අක්ෂිය නොහොත් ඇතුළු ඇස නමැති පැණැස ඇරවූයේ මීට අවුරුදු 2600 කට පෙර උදාවූ ඇසළ පොහෝ දිනයක බව වාර්තාවී තිබේ. බුදු හිමියන් විසින් දේශනාකරන ලද ප්‍රථම ධර්ම දේශනාව වන ධම්මචක්කප් පවත්තන සූත්‍රය අසා කොණ්ඩඤ්ඤ තවුසාණන් තුළ ධම්ම චක්ඛු නමැති දහම් ඇස ඇරුණු බව ඒ සූත්‍ර දේශනාව අවසානයේදී බුදු හිමියන් විසින්ම සඳහන් කරනු ලැබ ඇත.

මනැස නමැති ඇතුළු ඇස දහම් ඇස ලෙස හඳුන්වනු ලැබෙන්නේ මන නමැති හිතට දනෙනු ලැබෙන නිමිති හිතේ පහළවෙන චිත්ත රූප, ධම්ම නමින් හැඳින්වෙන බැවිනි. ඇසට රූපත්, කණට සද්දත්, නැහැයට ගඳසුවඳත්, දිවට රසයත්, ශරීරයට ස්පර්ශත් දනෙන්නා සේ මන නමැති හිතට ධර්ම නොහොත් ධම්ම නමැති නිමිති දනේ. එසේ මන නමැති හිතේ පහළවෙන ධර්ම නමැති චිත්ත රූපයන් පිළබඳව ඇතිවන ලෝභ-දෝස-මෝහ නමැති අකුශල මූලයන් පදම් කරගෙන ගොඩ නැගෙන ක්ලේශ ධර්මයන් නිසා මනසෙහිම සැඟවී ඇති ශ්‍රී සද්ධර්ය වැසී නොපෙනී යයි. මෝහය යනු එසේ ශ්‍රී සද්ධර්මය මනසට නොදනෙනසේ අඳුර කින් මෙන් වැසී තිබීමය. මොහඳුර යනු ඒ මානසික අන්ධකාරයයි. බුදු වදනින් සිදුවන්නේ ඒ මෝහාන්ධකාරය දුරුවී ප්‍රඥාවේ ආලෝකය උදාවීමකි. එය සිදු වන්නේ මනැස නමැති ඇතුළු ඇස විවෘත වීමෙනි.

බුදු කෙනෙකුට පවා ආරම්භයක් නොපෙනෙන සංසාරයේදී අනාදිමත් කාලයක සිට භවයෙන් භවය ගොඩගැසී ඇති කෙලෙස් කසළ කරණකොටගෙන පුහුදුන් මනස වසාගෙන ඇති මොහඳුර මායාවකි. දහම් ඇස ඇරීම යනු ඒ මායාකාර අඳුර විනිවිදගෙන ඇත්ත ඇති සැටියේ දකිය වීමයි. බුදුහිමියන්ගේ



**බරණැස ඉසිපතන මිගදායේ දී ශාක්‍ය මුනීන්ද්‍රයාණන් වහන්සේ තම ප්‍රථම ධර්ම පණිවුඩය ධම්මචක්කප්පවත්තන සූත්‍රය පස්වග මහණුන්ට දේශනා කළ අයුරු දැක්වෙන සාරානාත් හි ගුප්ත යුගයට අයත් 5 වන සියවසේ ගල්කැටයම**

This 5th century stone carving belonged to Guptha era depicts Sakyamuni's first sermon preached to his five disciples at Isipathana deer park in Benares.

**Commemorating the completion of 2600 years on 3 July 2012 after the Buddha's first sermon.**

ප්‍රථම ධර්ම දේශනය අසා කොණ්ඩඤ්ඤ තවුසාණන් තුළ අවදිවූ ධම්ම චක්ඛු නමැති දහම් ඇස ඒ දේශනාව අවසාන යේ දී බුදුහිමියන් විසින්ම විස්තර කරනු ලැබ ඇත්තේ "යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මන්ති "යනුවෙනි. එයින් කියවෙන්නේ ඇතිවෙන සියල්ලම නැතිවෙන බව කොණ්ඩඤ්ඤ තවුසාණන්ට අවබෝධවූ බවයි. ඉන් අදහස්-වන්නේ අනිත්‍යතාවය නමැති විශ්ව සාධාරණ සත්‍යය අවබෝධවූ බවකි.

අනිත්‍ය සත්‍යාවබෝධයෙන් සිදුවන්නේ ඇතිවෙවී නැතිවෙවී යන කිසිවක් සමග නොඇලෙන වීතරාගීබවක් හා එබඳු කිසිවක් සමග නොගැටෙන වීතදෝසී භාවයක් සිත තුළින්ම මතු වීමයි. ඒ සත්‍යාවබෝධය තුළ ඇත්තේ ඇත්ත ඇති සැටියේ නොපෙනෙන මෝහයෙන් මිදුණු වීතමෝහී චිත්ත ස්වරූපයකි. වීතරාගී වීතදෝසී විතමෝහී චිත්ත ස්වරූපයක් මතුවීම ආරියභාවයට පත්වීමකි.

එම නිසා බුදු හිමියන්ගේ බුද්ධත්වයෙන් පසු අවුරුදු 2600 කට පෙර ලොව පහළවූ ප්‍රථම ආර්ය ශ්‍රාවකයා ලෙස අඤ්ඤා කොණ්ඩඤ්ඤයන් වහන්සේ හැඳින්විය හැකිවේ.

♦ *සම්මානිත මහාචාර්‍ය*
*ටී. එස්. අබේවික්‍රම*
**Harrow UK**

## ✳ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✳

### හිතොපදේශයෙන්

අර්ත්ථාතුරාණං න ගුරුර් න බන්ධූර්
විද්‍යාතුරාණං න සුඛං න නිද්‍රා
කාමාතුරාණං න භයං න ලජ්ජා
ක්‍ෂුදාතුරාණං න රුචිර් න පත්ථ්‍යා

*අර්ථය : වස්තු රැස්කිරීමෙහි නියුක්ත වූවාහු ගුරුවරුන් ඥාතීන් නොලබන්නෝය. විද්‍යාව සොයා යන්නාහු සැපයහා නිද්‍රාව දුරුකරන්නෝය. කාමයෙන් පීඩිත වූවාහු භයහා ලැජ්ජාව නසන්නෝය. ක්‍ෂුධාවෙන් පීඩිත වූවාහු අභිරුචිය හා පථ්‍යය නොබලන්නෝය.*

මිනිසුන්ගේ සාමාන්‍ය ක්‍රියාකාරකම් 4 ක් ගැන ඉහතකී පද්‍යයෙන් විස්තර කර ඇත. ඉන් පළමුවැන්න නම් වස්තු රැස්කිරීමෙහි නිපුන් වූවන් ගුරුවරුන් හා ඥාතීන් නොලබන බවයි. මෙම පද්‍යය රචනා වූ කාලයේ එය එසේ වුවද වත්මන් සමාජය දෙස බලන විට ගුරුවරුන් හා ඥාතීන් පමණක් නොව වස්තු රැස්කිරීමේ යෙදෙන්නන් තම දෙමාපියන් ඇතුළු අඹුදරුවන් පවා අමතකකර දමා ඇති තැන් අපට බෝහෝ අවස්ථාවල අසන්නට හා දකින්නට ලැබේ.

මෙලොව ඇති බාහිර සම්පත් සදාකාලික ඒවා නොවේ. අපට ඒවා හැමදා පරිහරණය කළ නොහැකිය. හේතුව අපද සදාකාලික නොවන බැවිනි. එනිසා ජීවිත කාලය පුරාම රැස්කරකර නොඉඳ ජීවත්වන කාලයට ප්‍රමාණවත් ලෙස භුක්ති විඳීමට සපයාගැන්ම ඥානාන්විතය. නොඑසේ නම් හැමදාම නොලැබෙන දේ ගැන සිතා දුක්වීමට පසුතැවීමට සිදුවේ.

ඒ වගේම, කෙනෙක් අනුන්ගේ දේ බෙදාගැනීමට සිතන්නේ නම් එයින් පෙනෙන්නේ ඔහු ඒ ගැන ගිජුවී ඇති බවයි. අපොහොසත් තම අසල්වැසි ඥාතියා අමතක කර, යොදුන් ගණන් දුර පොහොසත් නෑයා සොයා ඔබ යනු ඇතැයි කියමනක්ද තිබේ. ඒ ගිජුකමේ ස්වභාවයයි. ඒ නිසා ධන තණ්හාවෙන් වෙළුණු පුද්ගලයාට ඥාතීන් ද මිතුරන් ද ගුරුවරු දෙමාපිය අඹුදරුවන් ද නැත.

මෙහි එන දෙවන කාරණය නම් ශිල්ප ශාස්ත්‍ර හදාරන්නන් එමගින් සිය සැපත හා නින්ද දුරුකරගන්නා බවයි. අධික ලෙස මහන්සි වී අධ්‍යාපනාදී කටයුතු කරන් නන්ට තම සුව පහසුව පිළිබඳව මූලිකව සිතන්නට ගිය හොත් තම අභිමතාර්ථය කෙරෙහි යා නොහැකිය. විනෝ දයට බරව අලසව කටයුතු කිරීමෙන් ශාස්ත්‍රීය කටයුතු පම ණක් නොව අනෙක් කටයුතුද අඩාල වනු නොඅනුමානය.

කාමාතුරයන්ගේ හෙවත් කාමයෙහි ලොල් වූවන්ගෙන් ඉවත්ව යන කාරණා දෙකක් ගැන තෙවනුව මෙහි සඳහන් කොට තිබේ. ඒ ලැජ්ජාව හා බයයි. මෙම දෙක ලෝක පාලක ධර්ම දෙක ලෙස ධර්මයේ සඳහන් කරයි. ඒවා නැත්තාට මෙලොව කළ නොහැකි පහත් දෙයක් නැත. ඔහු බිහිසුණු අපරාධ කරන්නට පෙළඹේ. කාමය මුවහතක තැවරූ පැණි මෙනැයි කියති. පැණි දිව පිනවන ඉතා මධුර දෙයක් වුවත් එය කෑම ඉතා පරිස්සමෙන් කළ යුත්තකි. මෙහි ලා වැදගත්වන්නේ කාමයෙහි අන්තගාමී නොවීමයි.

අවසාන කරුණ ලෙස සඳහන් කරන් නේ බඩ සයින් පෙලෙන්නන් විසින් ආහාරයේ ඇති රස හා ගුණාගුණ නොබලා බඩගිනි නිවාගැනීමට ලැබෙන දෑ ආහාරයට ගැනීමයි. ඒ රස හා ගුණ සෙවීමට ගියහොත් බඩගින්න තීව්‍රවන බැවිනි. එදිනෙදා ජීවිතය අපට කරදර වලි න් තොරව ගතකළ නොහැකිය. හොඳම දේ නම් ඒවා ඥාණාන්විතව විසඳාගැනීමයි. අප ඉගෙනගත යුත්තේ ලොකු ප්‍රශ්නයක් පොඩි එකක් කරගැන්මටත්, පොඩි ප්‍රශ්නයක් නැතිකර ගැනීමටත්ය. අපට අමිහිරි දෙයක් ඇසුනොත් එය යළි යළිත් සිහි නොකළ යුතුවා මෙන්ම මිහිරි යමක් ඇසුනොත් එය යළි යළි සිහිපත් කළ යුතු බවත්ය. වැටීම සාමාන්‍ය දෙයකි. නමුත් ඉන් නැගිටීමට අධිෂ්ඨාන කරගත යුතුය. නිතර අප හැම සිහියට ගත යුතු කාරණය ද එයයි.



♦ *රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති*
***පූජ්‍ය විල්බය විමලජෝති හිමි***
***ගල්ටැම්මණ්ඩිය පුරාණ විහාරය***
***ඔක්කම්පිටිය මොනරාගල***
**Sri Lanka**

**NORMA & Co**
**Associate Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772 / 07717173414**

**Any type of Visa Applications**
**Car Accidents**

***Colombo Office***
**Visa Applications & Any Refusals**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**